**පාකිස්ථානු නාවික හමුදාවට අයත් නෞකා දෙකක් කොළඹ වරායට**

පාකිස්ථානු නාවික හමුදාවට අයත් “හින්ගෝල්” *(Pakistan Maritime Security Ship -PMSS Hingol)* සහ “බාසෝල්” *(Pakistan Maritime Security Ship - PMSS Basol)* යන නෞකාවන් දෙක සුහද සංචාරයක් සඳහා ඊයේ දින (ජනඃ 05) කොළඹ වරායට පැමිණි බවත් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් නාවික සම්ප්‍රදායානුකූලව එම නෞකාවන් පිළිගන්නා ලද බවත් නාවික හමුදා නිළ වෙබ් අඩවිය සඳහන් කරයි.

ඒ අනුව එම නෞකා දින තුනක් මෙරට රැඳී සිටින අතර ශ්‍රී ලංකාව සමඟ සුහදතාවය වර්ධනය වන වැඩසටහන් කිහිපයකට එම නැව් මුළු සහභාග වීමට නියමිත වේ. එළැඹෙන ජනඃ 08 වැනි දින දිවයිනෙන් බැහැරව යාමට නියමිත බව එම පුවත වැඩිදුරටත් සඳහන් කරයි.